**මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,**

**----------------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**--------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 28 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 21 දිනද සභාවට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොගය ගිණුම්ගත නොකර රු.3,125,457 ක පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | තොග ගැලපීම් කර භෞතික තොගය ගිණුම්වලට ගත යුතුවේ. | තොග ගැලපුම් ගිණුම සකස් කරමින් පවතින අතර හැකි ඉක්මනින් විගණනය වෙත ඉදිරිපත් කරන බව දන්වමි. |
| (ආ) | රු.1,310,582 ක් වූ ණයහිමි ශේෂ 03 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. |
| (ඇ) | සභාව සතුව තිබූ කැබ් රථයක් රු.1,381,000 කට වෙන්දේසි කර තිබුණද ගිණුම්වලින් ඉවත් කිරීමට අදාල සටහන් තබා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් ගැලපීම සිදු කර ඇති බව දන්වමි. |

1.3.2 නොසැසඳුණු ගිණුම්

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් හා සසඳා | අදාල ශේෂවල වෙනස්කම් නිවැරදි කිරීමට | 2020 වර්ෂයේ නිවැරදි කර ඇති බව දන්වමි |

උපයෝගී ලේඛන අනුව ශේෂයන් කටයුතු කළ යුතුවේ.
අතර 2019 දෙසැම්බර් 31 දිනට
රු.4,952,803 ක වෙනසක් පැවතුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වසර 05 ක සිට පැවත එන රු.80,825 ක ජල තැන්පත් ශේෂය හා රු.6,445 ක අත්තිකාරම් බැර ශේෂයක් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ආදායමට ගත යුතු තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතින අතර පැරණි අත්තිකාරම් ශේෂය ලේඛන පරීක්ෂා කර බලා කමිටුවක් පත්කර ලේඛන වලින් කපා හැරීම සිදු කිරීම සඳහා කටයුතු කරගෙන යනු ලැබන බව දන්වමි. |
| (ආ) | 2016 හා 2017 වර්ෂවලට අදාල රු.5,097,989 ක් වටිනා ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සමිති හා අදාළ කොන්ත්‍රාත් ආයතන වෙත ගෙවිය යුතු මුදල් වන අතර ඉල්ලීම් ලද පසු ගෙවීම් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට වූ රු.73,246,845 ක මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂයට අදාල උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | ගිණුම් නිවැරදි කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (i) මුදල් රෙගුලාසි 371(2) | 784,907 | 2006 හා ඊට පෙර සිට පැවත එන රු.784,907 ක අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පියවීමට කටයුතු කළ යුතුවේ. | පැරණි ලේඛන පරීක්ෂා කර බලා කමිටුවක් පත්කර ලේඛන වලින් කපා හැරීම සිදු කිරීම සඳහා කටයුතු කරන බව දන්වමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 9,678,539 | 2011 සිට 2016 දක්වාවූ කල් ඉකුත්වූ තැන්පත් රු.9,678,539 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නියාදනය කාරීමට කටයුතු කළ යුතුවේ. | ලේඛන පරීක්ෂා කර ආදායමට ගත යුතු තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ආ) | බස්නාහිර පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ2018 ජූලි 19 දිනැති අංක 2018/e-Local Government-01 දරන චක්‍රලේඛය | - | අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ගෙවීම් සිදු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එම පහසුකම ලබාදීම සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව දන්වමි. |

2. **මූල්‍ය සමාලෝචනය**

---------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.160,213,391ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.129,358,930 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2019** | | | | **2018** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. |
| (i) | වරිපනම් හා බදු | 34,884 | 36,205 | 37,296 | 16,487 | 34,821 | 31,837 | 21,615 | 15,341 |
| (ii) | කුලී | 2,819 | 4,146 | 4,152 | - | 2,653 | 3,962 | 4,068 | 42 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,619 | 1,879 | 1.879 | - | 1,800 | 1,844 | 1,858 | 27 |
| (iv) | වෙනත් ආදායම් | 538 | 571 | 571 | 84 | 476 | 556 | 544 | 122 |
| | | 39,860 | 42,801 | 43,898 | 16,571 | 39,750 | 38,199 | 28,085 | 15,532 |

2.2.2 **වරිපනම් හා බදු**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට වූ හිඟ වරිපනම් ශේෂය අතර වසර 05 ඉක්මවූ රු.2,591,492 ක් විය. | හිඟ අය කිරීමට කටයුතු කළ යුතුවේ. | හිගය අය කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරන බව දන්වන අතර කපා හැරීමට සුදුසු බවට හඳුනාගත් වරිපනම් ඒකක ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා මහ සභා තීරණ ගෙන පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

2.2.3 කුලී

----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 05 ක් හා දේපල 02 ක් කුලියට නොදීම හේතුවෙන් අයවිය ආදායම් අහිමි වී තිබුණි. | සභාවේ ආදායම් වැඩි කර ගැනිම කෙරෙහි කළමනා කරණයේ අවධානය යොමු කරවමි. | අදහස් දක්වා නොමැත |
| (ආ) | පත්තඹුවන උප කාර්යාල ප්‍රදේශයේ කඩ කාමර 04 ක් සඳහා ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | නෛතික කරුණු කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කරවමි. | පත්තඹුවන උප කාර්යාලයේ කඩ කාමර 04 ක් සඳහා ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරගෙන යනු ලබන බව දන්වමි. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 කාර්යසාධනය

---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික කාර්යසාධන වාර්තාවේ අදාළ කර ගත යුතු අවශ්‍යතාවයන් වන හානි පාඩු ලේඛනය,වීදි ලාම්පු ලේඛනය, | වාර්ෂික කාර්ය සාධනයේ අවශ්‍යතාවන් ඉටු කළ යුතුවේ. | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කරමින් පවතින අතර ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම මූලිකම ගැටළුවක්ව පවතින හෙයින් |

| | | |
|---|---|---|
| මාර්ග ලේඛන පවත්වාගෙන යාම හා ගාස්තු අය කරන දේපල වසර 05 කට වරක් තක්සේරු කිරිම සිදු කර නොතිබුණි. | | හැකි ඉක්මනින් ව්‍යාපෘති සේවකයින් බඳවාගෙන දේපළ තක්සේරු කිරීම් ආරම්භ කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.2 **කළමණාකරන දුර්වලතා**

---------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ සූර්ය ජනක විදුලි පද්ධතියක් ස්ථාපිත කිරිම සඳහා 2015 වර්ෂයේදී රු.6,800,000 ක වැය කර "net metering" ක්‍රමවේදය යටතේ ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව දහවල් කාල සීමාව තුල අතිරික්ත විදුලි ඒකක සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මගින් කිසිදු ගෙවීමක් සිදු නොකරන අතර රාත්‍රී කාලය සඳහා විදුලි ඒකකයක් වෙනුවෙන් රු.15.40 ක අඩු ගාස්තු නිර්ණය කර තිබුණදමේ දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.මෙහි අනාගත ප්‍රතිලාභ සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබූ අතරකිලෝ වෝල්ට් ඇම්පියර් (KVA) ඒකකයට රු.1,100 ක් බැගින් අතිරේඛ ගාස්තු වැයවීම සම්බන්ධයෙන් වූ ගැටළුව නිරාකරණය කර ගැනීමනින් තොරව අවසන් ගෙවීම වූ රු.2,040,000 ක් ගෙවිම් කර තිබුණි. ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුළ අධික විදුලි වැයට පිලියමක් වශයෙන්, මෙය ස්ථාපිත කර තිබුණද, කාර්යාල පරිශ්‍රය වෙනුවෙන් මාසිකව අධික විදුලි වියදමක් දරමින් පැවති බැවින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘති ආරම්භ කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල වායුසමීකරණය කිරීමට අදහස් කර ඇති බැවින් වැඩි පරිභෝජනයක් සිදුවන බැවින් මෙම ක්‍රමවේදය වාසිදායක වන බව දන්වන අතර KV ඒකක ප්‍රමාණය වැය වීම සම්බන්ධව ඇති ගැටළුව නිරාකරණය කර ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදු කර සුදුසු පියවරක් ගැනීමටත් බලාපොරොත්තු නක බව දන්වමි. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.9,995,440 ක් වටිනා වොට් 100 LED වීථි ලාම්පු කට්ටල 728 ක් 2019 නොවැම්බර් 20 දින ගබඩාවට ලැබී 2019 දෙසැම්බර් 06 දින වන විට එම විදුලි උපාංග සියල්ල මාර්ග 07 කට සවිකර තිබූ බව තාක්ෂණ නිලධාරි (විදුලි) විසින් සහතික කර තිබුණද 2020 ජුනි 17 දින වන විටත් එම තොගය ගබඩාවේ තිබුණි.මෙම විදුලි උපකරණ තොගයේ වගකීම් කාලය වසර 03 ක් වූ අතර ඒ වන විටත් මාස 07 ක් ඉක්මවාගොස් තිබුණද මෙම උපකරණ තොගය පාවිච්චියට ගෙන නොතිබුණි. | නිවැරදි සහතික වීම් ලබා ගත යුතුවේ. | එම බල්බ තොගය සභාවට ලැබී ඇතත් නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මුදල් ලැබීමේ අවිනිශ්චිත බව හේතුවෙන් මෙම බල්බ සවිකිරීම ප්‍රමාද කර ඇති අතර බල්බ සවිකිරීම සිදු කළ දිනයේ සිට වසර 03 ක වගකීම් කාලය ලබා දෙන බවට එකගතාවය පළකර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 **භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවසන් ගිණුමේ දක්වා ඇති දිගින් දිගටම පැවත එන රු.76,980 ක්වූ කොම්පෝස්ට් බැරල් තොගය හා රු.33,948 ක වටිනා මුහුදු වැලි තොගය භෞතික තොග ගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සියළුම වත්කම් සමීක්ෂණයට ඉදිරිපත් කළ යුතුවේ. | කොම්පෝස්ට් බැරල් ශේෂය ද 2020 JE – 05 මගින් නිවැරදි කර ඇති අතර<br>මුහුදු වැලි තොගය භෞතික වශයෙන් වැඩ අංගනය තුළ තිබුණද තොග ගණනය සඳහා ලබාදීම අතපසු වී ඇත. |

3.4.2 **අභාවිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජල ගබඩා තොගය ලෙස දක්වා ඇති රු.162,995ක ශේෂය වසර 07 කට පෙර සිට පැවත එන අතර මින් කිසිදු තොග අයිතමයක් වසර 04 කින් භාවිතයට ගෙන නොතිබුණි. | අවශ්‍යතාවය අනුව මිලදී ගත යුතුවේ. | හියුම් පයිප්ප හැර සෙසු අයිතමයන් භාවිතය සඳහා ඉල්ලීම් නොකර අතර භාවිතයට නොගෙන දැනට ඉතිරිව ඇති තොග ශේෂය රු.162,995 ක් වේ. |

3.5 **ප්‍රසම්පාදනය**

--------------

3.5.1 කොන්ත්‍රාත් පාලනය

----------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණකාධිකාරීගේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ රු.998,111 ක් වැය කර කොන්ක්‍රීට් කර තිබූ අස්ගිරි වල්පොල ගිල්ම පොදු මාර්ගය පරීක්ෂා කිරීමේදී මාර්ගයේ දිග අඩි 253 ක කොටසක් මැනීම කලද ලිපි ගොනුව අනුව දිග අඩි 592 ක් වෙනුවෙන් රෙඩි මික්ස් සඳහා රු.963,583 ක් ගෙවීම් කර තිබුණි.ගොනුවේ දක්වා තිබූ මිනුම් වාර්තා හා භෞතික පරික්ෂාවේදී ලබා ගත් මිනුම් වාර්තා අතර වෙනසට හේතු වශයෙන් එම මාර්ගයේම කි.මි.03 ක වෙන්දේසි ඉඩමක මාර්ගයක් කොන්ක්‍රීට් කල බව ලිඛිතව ප්‍රකාශ කර තිබුණි. ඇස්තමේන්තු හා එම මිණුම් වාර්තා අනුව එහි එවැනි මාර්ග 02 ක් කොන්ක්‍රීට් කළ බවට නිරීක්ෂණය නොවූ අතර මිණුම් වාර්තා එක් ඉරක් යොදා දෙකට බෙදා වෙන් කිරීමක් කර තිබුණි. | මාර්ග 02 ක් කොන්ක්‍රීට් කිරීමේදී වෙනම ඇස්තමේන්තු හා මිණුම් පිළියෙල කළ යුතුවේ. | එම මාර්ගයේ ස්ථාන දෙකක කොන්ක්‍රීට් යොදා නිම කල අතර එම මිණුම් වාර්තා වෙන්කර හඳුනා ගැනීමට හැකි පරිදි සකස් කර නිවැරදි කරන ලදි. ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී එකම මාර්ගය කොන්ක්‍රීට් කිරීමට සැලසුම් කර තිබූ නමුත් වෙනත් මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම සිදු කර ඇත. |
| (ආ) | ගම්පෙරළිය ග්‍රාමීය වැඩසටහන යටතේ රු.766,274 ක මුදලකට වතුමුල්ල වීමෝල පාරේ ප්‍රසන්න මහතාගේ නිවස දෙසට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රෙඩිමික්ස් ඝණ මීටර් 37.83 ක් යෙදීමට ඇස්තමේන්තුකර තිබුණි. එසේ වුවද රෙඩිමික්ස් ඉන්වොයිසි අනුව ඝණ මීටර් 32.25ක් ලැබී තිබූ අතර ගෙවීම් වාර්තා අනුව ඝණ මීටර් 37.75 කට ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2019 ජනවාරි 23 දින ඝණ මීටර් 5.5 ක් සඳහා රු.81,180ක් වැඩිපුර ගෙවා තිබුණි. | ලැබීම් පත්‍රිකා මත ගෙවීම් සිදු කළ යුතුවේ. | ඝණ මීටර් 10.5 කට අදාළ ලැබීම් වාර්තා ගොනුවට අමුණා ඇත. |
| (ඇ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ රු.484,819 ක් වැය කරමින්හෙන්ඩිමහර පාසැල් පටුමඟ පලමු හරස් මාර්ගය අලුත්වැඩියාවට රෙඩිමික්ස් ඝණ මීටර් 31.10 ක් යෙදීමට ඇස්තමේන්තු කර තිබුණි.2018 දෙසැම්බර් 26 දින ලද රෙඩිමික්ස් වාර්තා අනුව ඝණ මීටර් 31 ක් ලැබී තිබූ බව දැක්වුවද රෙඩිමික්ස් ඝණ මීටර් 05 කට අදාල වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. ඒ අනුව නොලැබුණු රෙඩිමික්ස් සඳහා රු.60,000 ගෙවීම් කර තිබුණි. | නිවැරදි ලැබීම් විස්තර ඉදිරිපත් විය යුතුවේ. | එහිදී කොන්ක්‍රීට් ලැබීම් වාර්තා වලට අදාළව ඝණ මීටර් 5 ක ප්‍රමාණයක් සඳහා ලැබීම් වාර්තාව ගොනුගත කිරීමට ලැබී නැති බව හෝ වැඩ බිමේදී අස්ථාන ගත වන්නට ඇතැයි සිතිය හැක. |